# මේ කොයි යන්නේ

විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා තම බිරිඳගේ ආචාර්ය උපාධිය සම්බන්ධ කටයුත්තකට යැයි කියමින් එංගලන්තය බලාගොස් ආපසු එන විට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඒ රටට යයි. කවුරුන් කෙසේ කීවත් තවමත් අප රටට වඩාත්ම වැදගත් වන්නේ බ්‍රිතාන්‍යය. අප බ්‍රිතාන්‍යයෙන් යම් දේශපාලන නිදහසක් ලබා අවුරුදු හැටකට ආසන්න කාලයක් ගතවුණද, දේශපාලනය තීන්දු කිරීමේදී අපට එරටින් පරිපූර්ණව නිදහස්වීමට නොහැකි වී ඇත. රනිල් වික්‍රමසිංහ මහතා තම සංචාරයේදී නෝර්වීජියානු නියෝජිතයන්ද මුණගැසෙන්නට ඇත. එහෙත් වඩා වැදගත්වන්නට ඇත්තේ යම් බ්‍රිතාන්‍ය නියෝජිතයකු හා කළ සාකච්ඡාය. මෙරට අද පවත්නා ප්‍රශ්නය ඇති කළෝ බ්‍රිතාන්‍යයෝ හා ලන්දේසීහුය. එහිදී මෙරට රාජ්‍ය විසින් කරනු ලැබූ දෙයක් නොමැති දැයි එක්තරා රාජ්‍ය නොවන සංවිධානයක බැළයකු අසා තිබිණි. මේ බැළයන්ට තමන් එනමින් හඳුන්වනු ලැබූ විට කේන්ති යන බව ඔවුන් ලියන ලිපි ලේඛනවලින් පෙනී යයි. එහෙත් වැටුප් ලබමින් රාජ්‍ය නොවන සංවිධානවලට සේවයකරන ඔවුන්ට බැළයන් යැයි නොකියා කුමක් කියන්නද? අනෙක් අතට රාජ්‍ය නොවන සංවිධාන යනු පොදුවේ ගත්කල මේ බැළයන් ඔවුන්ගේ විවේචකයන් උපහාසයට ලක් කරමින් සඳහන්කරන ආකාරයට රාක්ෂස සංවිධාන නොව නූතන බමුණු සංවිධාන වෙයි. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව අපට අපේම ප්‍රවාදයක් වෙයි. ඒ ප්‍රවාදය බටහිර රටක පළවූ පොතක හෝ සඟරාවක නොමැති බැවින් බැළයන්ට හසු නොවෙයි.

බටහිර රටවල් මේ බැළයන්ට මෙතරම් කරුණාවෙන් මුදල් ලබාදෙන්නේ බටහිරයන් නූතන වෙස්සන්තර රජවරුන් බවට පත්වී ඇති බැවින්ද? වෙස්සන්තර රජු මද්‍රී දේවිය දන්දීම පිළිබඳව තවමත් මහාචාර්ය මෙයර් නම් ප්‍රංශ ජාතිකයා හෝ වෙනත් බටහිර උගතකු හෝ මතයක් ප්‍රකාශ කර නොමැති බව පැහැදිලිය. එසේ විණි නම් සිංහලයන්ට තවත් ඊනියා සම්භාව්‍ය නාට්‍යයක් හෝ චිත්‍රපටයක් හෝ දැකගැනීමට තිබිණි. කෙසේ වෙතත් මීයක් කඩන්නේ අත ලෙවකන්නට නොවේය යන්න වෙන කාටවත් වඩා බටහිරයන් සම්බන්ධයෙන් වලංගුය. බටහිරයන් තම මුදලින් අප වැනි රටවල රාජ්‍ය නොවන සංවිධාන පවත්වාගෙන යන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයෙහි එක් අංගයක් ලෙසය. බටහිරයන්ගේ මුදලින් පවත්වාගෙන යන රාජ්‍ය නොවන සංවිධාන යනු මරණාධාර සමිති හෝ එකල තිබූ ග්‍රාම සංවර්ධන සමිති, මහිලා සමිති ආදී සංවිධාන හෝ වැනි ආයතන නොවෙයි. ඒ සංවිධානවලට බටහිරයන්ගේ මුදල් නොලැබුණි. බටහිරයන්ගේ රාජ්‍ය නොවන සංවිධානවලින් කෙරෙන්නේ ආණ්ඩුවේ මතවාදයට විකල්පව තමන් මෙහෙයවන මතවාද කලාව හෝ වෙනත් මාධ්‍යයක් උපයෝගීකරගෙන ජනතාව අතරට යැවීමත් සුළු ආර්ථික ආධාර ඔස්සේ ජනතාවගෙන් යම් කොටසක් හෝ තමන්ට මෙහෙයවිය හැකි පිරිසක් බවට පත්කරගැනීමත් ආදී බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට අවශ්‍ය කටයුතුය. ඒ සඳහා ඊනියා උගත්තු එකා පසු පස යෑමට සැදී පැහැදී සිටිති. මේ උගතුන්ගෙන් ඇතැමෙක් විශ්‍රාමික හෝ වෙනත් ආකාරයක හෝ මාක්ස්වාදීහු වෙති. ඔවුන්ට තමන් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි ඒජන්තයන් ලෙසත් නූතන බමුණන් ලෙසත් හඳුන්වනු ලැබීම ප්‍රියමනාප නොවන බව අපි දනිමු. බමුණු බැළයන්ට ප්‍රියමනාප වුවද නැත්ද, අපි ඔවුන් එසේ හඳුන්වමු.

බ්‍රිතාන්‍ය මහා කොමසාරිස් ඩොමිනික් ජෝන් චිල්කොට් මහතා වීරකේසරි පුවත්පත සමඟ කළ සාකච්ඡාවකදී පළකළ අදහස් ටැමිල් නෙට් වෙබ් අඩවියෙහි කාහටත් බලාගැනීම සඳහා ඇත. ඔහු එහිදී කියා ඇත්තේ බ්‍රිතාන්‍යයන් ආපසු යන විට සුළුතරයෙහි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සෝල්බරි ව්‍යවස්ථාවට ඇතුළත් කළ විධිවිධාන ප්‍රමාණවත් නොවන බව දැන් අවබෝධ වී ඇති බවය. අර කලින් කියන ලද බත් බැළයාට නොතේරුණද, මෙරට වර්තමාන රාජ්‍යයම ඇති කෙළේ බ්‍රිතාන්‍යයන්ය. ඒ අර්ථයෙන් ගත් කල අපේ ප්‍රශ්නවලට බලපාන්නේ බ්‍රිතාන්‍යයන් විසින් ඇතිකරන ලද රාජ්‍යයන් ඔවුන් (හා ඊට පෙර ලන්දේසීන්) ගෙනගිය හා රාජ්‍ය නොවන බත් බැළයන් අද ද බටහිරයන් වෙනුවෙන් ගෙනයන ප්‍රතිපත්තීන්ය. බත් බැළයන් දැන් ප්‍රකාශ කරනු ඇත්තේ ඔවුන් කියන්නේත් ඒ බවත් ඒකීය රාජ්‍යය මේ ප්‍රශ්න සියල්ලටම වරදකරුවා බවත්ය. එහෙත් ඔවුන් දැනගත යුතු ප්‍රධාන කරුණක් වෙයි. එනම් බටහිරයන් පැමිණීමට පෙර මෙරට අවුරුදු දහස් ගණනක් තිස්සේ එක්සේසත් රාජ්‍යයක් තිබුණු බවය. එක්සේසත් රාජ්‍යයක් යනු බොහෝ කරුණු අතින් ඒකීය රාජ්‍යයකට සමාන විය. එහෙත් එහි ඇතැම් වෙනස්කම්ද විය. බ්‍රිතාන්‍යයන් විසින් ඇතිකරන ලද රාජ්‍යයේ වරද එහි ඒකීයභාවය නොව, එහි සිංහලත්වයට හිමිවිය යුතු තැන නොතිබීමය. බ්‍රිතාන්‍යයන් ඊනියා සුළු ජනවර්ගවල අයිතීන් රැකීමක් ගැන එදා කතා කළේත් අද කතා කරන්නේත් මෙරට සිංහලත්වයට හිමි

© Prof. Nalin De Silva

තැන නොදීමටය. මෙරට ප්‍රශ්නය සිංහලත්වයට හිමි තැන නොලැබීම (නොදීම) මිස සුළු ජනවර්ගවලට වූ ඊනියා අසාධාරණ නොවෙයි. අද අප කළයුත්තේ හැකිතාක් දුරට ජනසම්මතවාදය අනුගමනය කරමින් මෙරට එක්සේසත් රාජ්‍යයක් හෝ එයට කිට්ටු රාජ්‍යයක් ඇතිකර ගැනීමය. අද අප ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටින්නේ ඒ අර්ථයෙන් මිස බ්‍රිතාන්‍යයන් විසින් ඇතිකරන ලද රාජ්‍යය දිගින් දිගටම පවත්වාගෙන යැම සඳහා නොවෙයි. අපට අවශ්‍යවන්නේ එක්සේසත් රාජ්‍යයකි. ඒ ඒකීය රාජ්‍යයට වඩා යහපත්ය. එක්සේසත් රාජ්‍යයක් ඇති කරගැනීමට හැකිනම් අප කළයුත්තේ ඒකීය රාජ්‍යය ද අමතක කිරීමය.

බ්‍රිතාන්‍ය මහා කොමසාරිස්වරයා ඊනියා සුළුජාතීන් ගැන කතා කරන්නේ සුළු ජාතිය යන සංකල්පයම ඔවුන්ගේ නිර්මාණයක් බව අමතක කරමින්ය. ඔවුන්ගේ බෙදා වෙන්කර පාලනය කිරීම අප රටට පමණක් සීමා වූවක් නොවේ යැයි මහා කොමසාරිස්වරයා පවසයි. අපි එය දනිමු. මුළු මහත් ලෝකයම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ යටත්විජිතවාදයට හසුකිරීම සඳහා ඔවුහු බෙදා වෙන්කර පාලනය කිරීමේ ප්‍රතිපත්තිය ඔවුන්ගේ බොහෝ යටත්විජිතවල ක්‍රියාත්මක කළහ. අප රටෙහි ඊනියා සුළු ජනවර්ග ඇති කෙරුණේ බෙදා වෙන්කර පාලනය කරමින් සිංහලත්වයට හිමි තැන අහිමි කිරීමටය. ටැමිල් නෙට් වෙබ් අඩවියට අනුව මහා කොමසාරිස් විල්කොට් මහතා වීරකේසරී පුවත්පත සමග කරන ලද සාකච්ඡාවේදී තවදුරටත් කියා ඇත්තේ බ්‍රිතාන්‍යයන් 1796 දී මෙරටට පැමිණෙන විට මෙරට රාජ්‍ය තුනක් තිබූ බවය. ඔහු ඒ කිනම් රාජ්‍ය දැයි නොකියයි. බ්‍රිතාන්‍යයන් ආක්‍රමණිකයන් ලෙස මෙරටට පැමිණෙන විට මෙරට ලන්දේසීහු මුහුදුබඩ ඇතැම් පෙදෙස් ආණ්ඩුකළහ. එහෙත් රටේ අනෙක් කොටස් පාලනය කළේ සිංහල රජුය. අද නැගෙනහිර පළාත යැයි හැඳින්වෙන ප්‍රදේශයෙහි වෙරළ තීරුව පවා සිංහල රජු යටතේ පැවතිණි. ඒ තීරුව ගිවිසුමක් මගින් තාවකාලිකව ලන්දේසීන්ට ලබාදී තිබුණු නමුත් ඒ ප්‍රදේශයද සිංහල රාජ්‍යයට අයත් විය. බ්‍රිතාන්‍යයන් මෙරට ආක්‍රමණිකයන් ලෙස පැමිණෙන විට මෙරටට රාජ්‍ය තුනක් නොතිබිණි. මෙරට තිබුණේ මහනුවර අගනුවර කරගත් සිංහල රාජ්‍ය හා ලන්දේසි ආක්‍රමණිකයන්ගේ මුහුදුබඩ පාලන ප්‍රදේශයකි. ඒ පාලන ප්‍රදේශයට ලන්දේසීන් වර්තමාන නැගෙනහිර පළාතේ වෙරළ තීරුව ගිවිසුමක් මගින් ඈඳාගෙන තිබිණි. එහි එයට වැඩි දෙයක් තිබිණි නම් ඒ ලන්දේසීන් තමන් පාලනය කළ යාපන ප්‍රදේශයට දකුණු ඉන්දියාවේ කෝරමණ්ඩල වෙරළෙන් දෙමළ ගොවීන් (වෙල්ලාල) ගෙන්වා තිබීමය. විල්කොට් මහතා තමන් නොදන්නා ඉතිහාසයක් ගැන කතා කරන්නේ එක්කෝ ඔහුට ලැබුණු අසත්‍ය තොරතුරක් මත පදනම් වීය. එසේත් නැත්නම් පුරුතුගීසීන් මෙරට ආක්‍රමණය කළ අවදියෙහි මෙරට රාජ්‍ය තුනක් තිබූ බවට ඇතැම් ඉතිහාසඥයන් නොසැලකිල්ලෙන් කරන කතා බ්‍රිතාන්‍යයන් ආක්‍රමණය කළ කාලයටද වලංගු යැයි සිතමින්ය. එහෙත් මේ කතා ඇතැම් අයද අනුකරණය කරනු ඇත්තේ විල්කොට මහතාගේ ඉතිහාසය පිළිබඳ දැනුමට වශී වී නොව ඔහු මෙරට බ්‍රිතාන්‍ය නියෝජනය කරන්නා බව සිහියට නගමින්ය. විල්කොට් මහතා කියන්නේ එසේ පැවති රාජ්‍ය තුන බ්‍රිතාන්‍යයන් තම පරිපාලන පහසුව සඳහා එක් ප්‍රදේශයක් බවට පත්කළ බවය. අපේ පැරැන්නන් අනේ මගේ කට යැයි කීවේ මෙවැනි පඬිවදන් ඇසුණු විටය. බ්‍රිතාන්‍යයන් සිංහල රජු පාලනය කළ රාජ්‍යය ඩොයිලිගේ සටකපට ක්‍රියා ඔස්සේ ඊනියා උඩරට ගිවිසුමෙන් තමන්ට පවරාගත් බව අපි දනිමු. ඔවුන් ඔය කියන අනෙක් රාජ්‍ය දෙක ලබාගත්තේ කාගෙන්ද? කෙසේද?

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එංගලන්තයට යැම පිළිබඳව නෝර්වේහි ගුවන් විදුලියක් කළ ප්‍රකාශයක් පිළිබඳවත් ටැමිල් නෙට් වෙබ් අඩවියෙහි සඳහන් වෙයි. අදාළ ගුවන් විදුලිය මෙරට නෝර්වේ සාම නියෝජිතයා යැයි කියන බවර් (ඔහු කොටි නියෝජිතයා යැයි කීම නිවැරදිය) උපුටා දක්වමින් කියා ඇත්තේ රාජපක්ෂ මහතා එංගලන්තයට ගොස් ඇත්තේ බ්‍රිතාන්‍ය රජය ලවා තම ප්‍රතිපත්තිවලට ඉන්දියාව එකඟ කරගැනීමට විය හැකි බවය. මෙහි සත්‍යාසත්‍ය භාවය ගැන අපට කිසිවක් කිව නොහැකිය. එහෙත් ඒ සත්‍යයක් නම් රාජපක්ෂ මහතා ගොස් ඇත්තේ වැරදි තැනකටය. වැරදි උපකල්පන සහිතවය. ඉන්දියාව උඩින් කුමක් කීවත් අද කොටි සංවිධානය පරාජය කිරීමට උපකාර නොකරනු ඇත. 1987 දී ඔවුන් ඊනියා සාම හමුදාව ලංකාවට එවූයේ කොටි පරාජය කිරීමට වඩා ඔවුන්ගේ එකල නියෝජිතයා වූ ඊ. පී. ආර්. එල්. එෆ්. කණ්ඩායම උතුරේ හා නැගෙනහිර බලයට පත් කරවීමටය. අනෙක් අතට දෙවැනි ධ්‍රැවීකරණයකට පාත්‍රවෙමින් සිටින ඉන්දියාව අද බටහිරයන් අනුගමනය කරයි. එයට අමතරව බ්‍රිතාන්‍යය රාජපක්ෂ මහතාගේ ප්‍රතිපත්තිවලට අනුකූලතාවක් නොදක්වයි. රාජපක්ෂ මහතා තම ප්‍රතිපත්තිවලට සහාය ලබාගැනීම සඳහා අද යා යුත්තේ පකිස්තානයට, චීනයට හා අනෙක් ථෙරවාදී රටවලටය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva